# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 24 දරන
# ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි
# පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ජූලි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1982 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 1.10 යි　　තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පනත

[සහතිකය සටහන් කළේ 1982 ජූලි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 19/81.

**ගුවන් යානාවල ආරක්ෂාව හා සම්බන්ධ වූ ද ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වූ ද ඇතැම් සම්මුති, එනම් :—**

**(අ) 1963 සැප්තැම්බර් මස 14 වන දින ටෝකියෝ හි දී අත්සන් කරන ලද ගුවන් යානා තුළ කරනු ලබන වැරදි සහ ඇතැම් වෙනත් ක්‍රියා හා සම්බන්ධ සම්මුතිය ;**

**(ආ) 1970 දෙසැම්බර් මස 16 වන දින හේග් හි දී අත්සන් කරන ලද ගුවන් යානා නීති විරෝධී ලෙස අල්ලා ගැනීම මැඩ පැවැත්වීම සඳහා වූ සම්මුතිය ; සහ**

**(ඇ) 1971 සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියල් හි දී අත්සන් කරන ලද, සිවිල් ගුවන් ගමනාගමනයේ ආරක්ෂාවට එරෙහිව වූ නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය**

**යන සම්මුති ඵලගැන්වීම සඳහා සහ ඊට සම්බන්ධ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකාව ඉහත කී සම්මුතිවලට පාර්ශ්වකරුවකු වන හෙයින් ද ; පූර්විකාව.

ගුවන් යානාවලට එරෙහිව හෝ ගුවන් යානා හා සම්බන්ධව කරනු ලබන ඇතැම් ක්‍රියා ජාතීන්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියා ලෙස මේ සම්මුති මගින් පිළිගෙන ඇති හෙයින් ද ;

ශ්‍රී ලංකාවේ නීතිය යටතේ මේ ක්‍රියාවලට දඬුවම් පැමිණවීම සඳහා විධිවිධාන සැලැස්වීමට ජාත්‍යන්තර නීතිය යටතේ ශ්‍රී ලංකාව බැඳී සිටින හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. (1) මේ පනත 1982 අංක 24 දරන ගුවන් යානාවලට එරෙහිව වූ වැරදි පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

(2) මේ පනතේ 2 වන වගන්තියේ සහ I වන කොටසේ විධිවිධාන මේ පනත පැනවූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වීම—

(අ) 1970 දෙසැම්බර් මස 16 වන දින හේග් හි දී අත්සන් කරන ලද ගුවන් යානා නීති විරෝධී ලෙස අල්ලා ගැනීම මැඩ පැවැත්වීම සඳහා වූ සම්මුතිය ; සහ

(ආ) 1971 සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියල් හි දී අත්සන් කරන ලද සිවිල් ගුවන් ගමනාගමනයේ ආරක්ෂාවට එරෙහිව වූ නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා වූ සම්මුතිය

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බල පැවැත්වීම ආරම්භ වූ දිනය වන 1978 ජූලි මස 3 වන දින ආරම්භ වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර ඒ කොටස යටතේ වූ වරදක් සංයුක්ත කරන යම්

2—ඒ 64332—14,675 (82/07)

ක්‍රියාවක් හෝ නොකර හැරීමක් 1978 ජූලි මස 3 වන දින හෝ ඉන් පසුව කර ඇති යම් තැනැත්තකු, ඒ කොටසේ විධිවිධාන යටතේ ඒ වරද සම්බන්ධයෙන් නඩු විභාගයට භාජන කරනු ලැබ දඬුවම් කරනු ලැබීමට ඒ අනුව යටත් විය යුතු ය.

නිසි බලධරයා.

2. ගුවන් ගමනාගමන පනත යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා මේ පනතේ කාර්ය සඳහා නිසි බලධරයා වන්නේ ය.

## I වන කොටස

සම්මුතියේ ගිවිස්නා රාජ්‍යයන් අමාත්‍යවරයා විසින් සහතික කළ හැකි බව.

3. සම්මුතියේ කාර්ය සඳහා ගිවිස්නා රාජ්‍යයන් කවරේදැයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් සහතික කළ හැකි ය. එවැනි සෑම නියමයක් ම එසේ සහතික කරනු ලැබූ කාරණා සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

ශ්‍රී ලංකා ගුවන් යානයක් තුළ සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් අධිකරණ වලට ඇති අධිකරණ බලය.

4. (1) ගමනාවතීර්ණව හෝ මහා සමුද්‍රය මත හෝ යම් රාජ්‍යයක භූමියට අයත් නොවන ප්‍රදේශයක් මත ඇති ශ්‍රී ලංකා ගුවන් යානයක් තුළ සිදු කරනු ලබන හෝ සිදුවන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, එම ක්‍රියාව හෝ නොකර හැරීම ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලැබූ විටක හෝ සිදු වූ විටක ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වරදක් සංයුක්ත කරන්නේ නම්, එම ක්‍රියාව හෝ නොකර හැරීම කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් වුව ද නොවුව ද, එම වරද සංයුක්ත කරන්නේ ය.

(2) ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වරදක් වන (දේශපාලනමය ස්වභාවයක හෝ වාර්ගික හෝ ආගමික වෙනස්කම් කිරීමක් මත පදනම් වූ වරදක් නොවන) යම් වරදක් ගමනාවතීර්ණව හෝ මහා සමුද්‍රය මත හෝ යම් රාජ්‍යයක භූමියට අයත් නොවන ප්‍රදේශයක් මත ඇති ශ්‍රී ලංකා ගුවන් යානයක් තුළ සිදු කරන ලද අවස්ථාවක එම වරද ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබුවේ නම් ශ්‍රී ලංකාවේ නීතිය යටතේ—

(අ) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි වරදක් නම්, ඒ පිළිබඳ නඩු විභාගය කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පැවැත්විය යුතු ය ;

(ආ) මහාධිකරණය විසින් නඩු විභාග කළ හැකි වරදක් නම් ඒ පිළිබඳ නඩු විභාගය කොළඹ අධිකරණ කලාපය තුළ පවත්වනු ලබන මහාධිකරණය විසින් පැවැත්විය යුතු ය.

ශ්‍රී ලංකා ගුවන් යානයක අණ දෙන නිලධරයා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ලෙස සැලකිය යුතු බව.

5. ශ්‍රී ලංකා ගුවන් යානයක සෑම අණ දෙන නිලධරයකුම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතින් සාම නිලධරයකු වෙත පවරනු ලැබ ඇති යම් බලයක් ඔහු විසින් 4 වන වගන්තියේ සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ය.

සම්මුතියේ III වන පරිච්ඡේදයේ විධිවිධාන බලට ශ්‍රී ලංකාව තුළ නීතියේ බලපෑම තිබිය යුතු බව.

**6.** (1) සම්මුතියේ III වන පරිච්ඡේදයේ විධිවිධාන වන්නා වූ, මේ පනතේ උපලේඛනයේ විධිවිධාන, ශ්‍රී ලංකා ගුවන් යානයක් ගමනාවතීර්ණව හෝ මහා සමුද්‍රය මත හෝ යම් රාජ්‍යයක භූමියට අයත් නොවන ප්‍රදේශයක් මත ඇති විට, එම ගුවන් යානය තුළ සිදු කරන ලද වැරදි සහ ක්‍රියා සම්බන්ධයෙන් එම ගුවන් යානයේ අණදෙන නිලධරයාට අදාළ වන තාක් දුරට, එම විධිවිධානවලට ශ්‍රී ලංකාව තුළ නීතියේ බලපෑම තිබිය යුතු ය.

(2) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන සහ වෙනත් යම් නීතියක විධිවිධාන අතර අනනුකූලතාවක් ඇති වුවහොත්, එම උපලේඛනයේ විධිවිධාන එකී වෙනත් නීතියේ විධිවිධාන අභිබවා බලපැවැත්විය යුතු ය.

උපලේඛනයේ විධිවිධානවලින් ගුවන් යානා අණදෙන නිලධරයකුට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා විරෝධය පෑම හෝ බාධාකිරීම වරදක් බව.

**7.** මේ පනතේ උපලේඛනයෙන් ශ්‍රී ලංකා ගුවන් යානයක අණ දෙන නිලධරයකු වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඔහුට විරෝධය පාන හෝ බාධා කරන යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු විය යුතු ය.

ගුවන් යානා අණදෙන නිලධරයාට සහාය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ එය පැහැර හැරීම වරදක් බව.

**8.** මේ පනතේ උපලේඛනයේ 6 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකා ගුවන් යානයක අණ දෙන නිලධරයා වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඔහු විසින් නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ විටක, එම ගුවන් යානය තුළ සිටින යම් තැනැත්තකු මෙල්ල කිරීමට ඒ අණදෙන නිලධරයාට සහාය වීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන එම ගුවන් යානයේ නියමු පිරිසේ යම් සාමාජිකයකු මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු විය යුතු ය.

ගුවන් යානා අණදෙන නිලධරයකු විසින්, වැරදිකරු යානයෙන් බැස්සවීමේ හෝ වැරදිකරු භාර දීමේ අදහස වාර්තා කිරීම පැහැර හැරීම වරදක් බව.

**9.** මේ පනතේ උපලේඛනයේ—

(අ) 8 වන ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ විධිවිධානවලට ; හෝ

(ආ) 9 වන ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ විධිවිධානවලට හෝ

අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින ශ්‍රී ලංකා ගුවන් යානයක අණ දෙන නිලධරයකු මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරද කරු විය යුතු ය.

මේ පනතේ මේ කොටස යටතේ වූ වැරදි.

**10.** (1) මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, එක් අවුරුද්දකට නොවැඩි කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ යටත් විය යුතු ය.

(2) මහාධිකරණය විසින් නඩු විභාග කළ යුතු වරදක් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතින් මහේස්ත්‍රාත්වරයකු වෙත යම් බලයක් පැවරී ඇති හෝ කාර්යයක් නියම වී ඇති අවස්ථාවක, මේ පනතේ මේ කොටස

යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විට එම බලය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් කළ යුතු ය.

ගිවිස් නා රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයක අණදෙන නිලධර යා ට සම්මුතියට අනුකූලව තැනැත් තන් යානයෙන් බැස් ස වීමට හෝ භාරදීමට හෝ ඉඩ දිය යුතු බව.

**11.** මේ පනතේ උපලේඛනයේ 8 වන ව්‍යවස්ථාවට අනුකූලව යම් තැනැත්තකු යානයෙන් බැස්සවීමට හෝ මේ පනතේ උපලේඛනයේ 9 වන ව්‍යවස්ථාවට අනුකූලව යම් තැනැත්තකු භාරදීමට ගිවිස්නා රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයක අණදෙන නිලධරයා අදහස් කරන බව උචිත බලධර යන්ට දැන්වූ අවස්ථාවක, ඔහුගේ ගුවන් යානය ශ්‍රී ලංකාවට ගොඩ බැස්සවීමට සහ එකී තැනැත්තා යානයෙන් බැස්සවීමට හෝ භාර දීමට ඒ අණදෙන නිලධරයාට ඉඩ දෙනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකාවේ උචිත බලධරයන් එසේ යානයෙන් බස්සවන ලද හෝ භාර දෙන ලද යම් තැනැත්තකු තමන් භාරයට ගත යුතු ය.

තැනැත් තකු භාරදුන් විට නිසි බලධරයාගේ කාර්ය.

**12.** (1) ගිවිස්නා රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යාන යක අණ දෙන නිලධරයා විසින් මේ පනතේ උපලේඛනයේ 9 වන ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකාවේ උචිත බලධරයන්ට යම් තැනැත්තකු භාර දුන් විට නිසි බලධරයා විසින්—

(අ) සිද්ධි සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්විය යුතු ය ;

(ආ) එසේ භාරදෙනු ලැබූ තැනැත්තා රටවැසියකු වන රාජ්‍යයේ ආසන්නතම උචිත නියෝජිතයා සමග පණිවුඩ හුවමාරු කර ගැනීමට ඒ තැනැත්තාට සහාය දිය යුතු ය ;

(ඇ) ඒ තැනැත්තා එසේ භාර දෙනු ලැබ ඇති බවත් ඔහු රඳවා තබා ගැනීමට හේතුවූයේ කවර පරිවේෂණ යටතේ ද යන බවත්—

(i) ඒ ගුවන් යානය ලියාපදිංචි කරනු ලැබූ ගිවිස්නා රාජ්‍යයට ;

(ii) එසේ භාරදෙනු ලැබූ තැනැත්තා ශ්‍රී ලංකාවේ රටවැසි යකු නොවේ නම්, ඔහු රටවැසියකු වන රාජ්‍යයට ;

(iii) සම්බන්ධතාවක් ඇති වෙනත් යම් රාජ්‍යයකට

දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් මූලික පරීක්ෂණ අවසාන වීමෙන් පසු නිසි බලධරයා විසින් ස්වකීය තීරණ එම උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් රාජ්‍යවලට වාර්තා කළ යුතු අතර, මූලික පරීක්ෂණයට අදාළ වූ වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව අදහස් කරන්නේ ද යන වග සඳහන් කළ යුතු ය.

යානයෙන් බැස් ස වූ හෝ භාරදෙනු ලැබූ තැනැත් තාට විරුද් ධව අපරාධ හෝ උද්දර්පන නඩු කටයුතු පවරා නැත් නම්, ඔහුට ශ්‍රී ලංකාවෙන් පිටවීමට ඉඩ දිය යුතු බව.

**13.** ගිවිස්නා රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයක අණ දෙන නිලධරයා විසින් සම්මුතියේ 8 වන ව්‍යවස්ථාවට අනු කූලව යානයෙන් බස්සවන ලද හෝ සම්මුතියේ 9 වන ව්‍යවස්ථාවට අනුකූලව භාර දෙන ලද—

(අ) යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ නඩු කටයුතු පවරා නැති ; හෝ

(ආ) යම් තැනැත්තකු උද්දර්පනය කිරීම සඳහා නඩු කටයුතු ආරම්භ කර නැති

අවස්ථාවක, තමාගේ ගමන නොනවත්වා කරගෙන යාමට ඒ තැනැත්තා අදහස් කරන්නේ නම් ඔහු කැමති ගමනාන්තයක් බලා පිටත් වීමට ඔහුට ඉඩ දෙනු ලැබිය යුතු ය. එහෙත් තමාගේ ගමන නොනවත්වා කරගෙන යාමට ඒ තැනැත්තා අදහස් නොකරන්නේ නම්, නිසි බලධරයා විසින්, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම්, ඔහු රටවැසියකු හෝ ස්ථිර පදිංචිකරුවකු වන රාජ්‍යයට හෝ ඔහුගේ ගුවන් ගමන ආරම්භ කළ රාජ්‍යයට ඔහු ආපසු යැවිය යුතු ය.

යානයෙන් බැස් සවීම හෝ භාරදීම ශ්‍රී ලංකාවට ඇතුළුවීමට අවසර දීමක් ලෙස නොසැලකිය යුතු බව.

**14.** යම් තැනැත්තකු සම්මුතියේ 9 වන ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකාවේ උචිත බලධරයන්ට භාර දෙනු ලැබීමේ හෝ සම්මුතියේ 8 වන ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකාවේ දී යානයෙන් බස්සවනු ලැබීමේ හේතුව නිසාම පමණක් ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවට ඇතුළු වීමට අවසර දුන් ලෙස නොසැලකිය යුතු ය.

ගිවිස්නා රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයක් තුළ සිදු කරන ලද වැරදි එම රාජ්‍යය තුළ සිදු කරන ලද වැරදි විය යුතු බව.

**15.** ගිවිස්නා රාජ්‍යයක ලියාපදිංචි කරන ලද ගුවන් යානයක් තුළ කරන ලද, එම රාජ්‍යයේ නීතිය යටතේ වරදක් සංයුක්ත කරන යම් ක්‍රියාවක්, එම රාජ්‍යයේ අධිකරණ බල සීමාව තුළ සිදු කරන ලද ක්‍රියාවක් ලෙස, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පන පනතේ කාර්ය සඳහා සැලකිය යුතු ය.

අර්ථ නිරූපනය.

**16.** මේ පනතේ මේ කොටසෙහි—

"සම්මුතිය" යන්නෙන්, 1963 සැප්තැම්බර් මස 14 වන දින ටෝකියෝ හි දී අත්සන් කරන ලද ගුවන් යානා තුළ කරනු ලබන වැරදි සහ ඇතැම් වෙනත් ක්‍රියා හා සම්බන්ධ සම්මුතිය අදහස් වේ;

"ගිවිස්නා රාජ්‍යය" යන්නෙන්, සම්මුතියට පාර්ශ්වකරුවකු වූ රාජ්‍යයක් අදහස් වේ;

"ගමනාවතීර්ණ" යන්න ගුවන් යානයක් සම්බන්ධයෙන් යෙදුනු විට, ගුවන් යානය ගුවන්ගත්වීමේ කාර්යය සඳහා ඊට බලය සැපයූ මොහොතින් ආරම්භව ගොඩබැස්සවීමේ ධාවනය අවසාන වන මොහොතින් අවසාන වන කාල පරිච්ඡේදය අදහස් වේ;

"ශ්‍රී ලංකා ගුවන් යානය" යන්නෙන්, ගුවන් ගමනා ගමන පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද්දා වූ ද යුද්ධ හමුදා, රේගු හෝ පොලිස් සේවාවල පාවිච්චි වෙමින් පවතින ගුවන් යානයක් නොවන්නා වූ ද ගුවන් යානයක් අදහස් වේ.

## II වන කොටස

ගුවන් යානයක් තුළ හෝ ගුවන් යානයකට එරෙහිව කරනු ලබන වැරදි.

**17.** (1) පහත සඳහන් යම් දෙයක් කරන යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වූ වරදකට වරදකරු විය යුතු අතර, කොළඹ දී පවත්වනු ලබන මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කරනු ලැබීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය :—

(අ) ගමනාවතීර්ණ ශ්‍රී ලංකා ගුවන් යානයක් තුළ දී නීති විරෝධී ලෙස බලෙන් හෝ තර්ජනයෙන් හෝ වෙනත් බියගැන්වීම් ක්‍රමයකින් එම ගුවන් යානය අල්ලා ගැනීම හෝ එය පාලනය කිරීම; හෝ

(ආ) ගමනාවතීර්ණ ශ්‍රී ලංකා ගුවන් යානයක් තුළ සිටින තැනැත්තකුට එරෙහිව එම ගුවන් යානයේ ආරක්ෂාවට හානිදායක විය හැකි ප්‍රචණ්ඩ ක්‍රියාවක් නීති විරෝධී ලෙස සහ චේතනාන්විතවම කිරීම ; හෝ

(ඇ) සේවාස්ථ ශ්‍රී ලංකා ගුවන් යානයක් නීති විරෝධී ලෙස සහ චේතනාන්විතවම විනාශ කිරීම ; හෝ

(ඈ) සේවාස්ථ ශ්‍රී ලංකා ගුවන් යානයක් පියාසර කරවිය නොහැකි කරවන හෝ ගමනාවතීර්ණව තිබිය දී එහි ආරක්ෂාවට හානිකරවිය හැකි යම් හානියක් එම ගුවන් යානයට නීති විරෝධී ලෙස සහ චේතනාන්විතවම කිරීම ; හෝ

(ඉ) සේවාස්ථ ශ්‍රී ලංකා ගුවන් යානයක් තුළ—

(i) එම ගුවන් යානය විනාශ කළ හැකි ; හෝ

(ii) එම ගුවන් යානය පියාසර කරවිය නොහැකි තත්ත්වයකට පත් කරවිය හැකි හෝ ගමනාවතීර්ණව තිබිය දී එහි ආරක්ෂාවට හානිකර විය හැකි

යම් උපක්‍රමයක් හෝ ද්‍රව්‍යයක් කවර හෝ ක්‍රමයකින්, නීති විරෝධී ලෙස සහ චේතනාන්විතවම තැබීම හෝ තැබීමට සැලැස්වීම ; හෝ

(ඊ) ගමනාවතීර්ණ ශ්‍රී ලංකා ගුවන් යානයක ආරක්ෂාවට හානිකර විය හැකි පරිදි, ජාත්‍යන්තර ගුවන් ගමනාගමන පහසුකම් වලට යම් හානියක්, විනාශයක් හෝ එම පහසුකම් ක්‍රියාත්මක කරවීමට අයුතු ලෙස මැදිහත් වීමක්, නීති විරෝධී ලෙස සහ චේතනාන්විතවම කිරීම ; හෝ

(උ) ගමනාවතීර්ණ ශ්‍රී ලංකා ගුවන් යානයක ආරක්ෂාවට හානිකර විය හැකි වූ ද, අසත්‍ය බව ඔහු දන්නා වූ ද, තොරතුරක් නීති විරෝධී ලෙස සහ චේතනාන්විතවම සන්නිවේදනය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට තැත් කරන හෝ අනුබල දෙන යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු විය යුතු අතර, කොළඹ දී පවත්වනු ලබන මහාධිකරණය ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, පළමුවෙන් සඳහන් කරන ලද වරදට නියම කරනු ලැබ ඇති දඬුවමටම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මේ උපවගන්තියේ, "අනුබලදීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවල, ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(3) මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් පිළිබඳ නඩු විභාගය කොළඹ අධිකරණ කලාපය තුළ පවත්වනු ලබන මහාධිකරණය ඉදිරියේ පැවැත්විය යුතු ය.

**මේ පනතේ මේ කොටස යටතේ වූ වැරදි සංඥෙය හා ඇප දිය නොහැකි වැරදි විය යුතු බව.**

18. (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, මේ පනතේ මේ කොටස යටතේ වූ සෑම වරදක් ම, ඒ පනතේ අර්ථානුකූලව ද එහි කාර්ය සඳහා ද—

(අ) සංඥෙය වරදක් විය යුතුය ;

(ආ) ඇප දිය නොහැකි වරදක් විය යුතු ය.

තව ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත බලපවත්නාතාක් කල්, එහි සෑම

වරදක් ම ඒ පනතේ පළමුවන උපලේඛනයේ ඇතුළත් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මහාධිකරණය විසින් නඩු විභාග කළ යුතු වරදක් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් මහෙස්ත්‍රාත්වරයකු වෙත යම් බලයක් පැවරී ඇති හෝ කාර්යයක් නියම වී ඇති අවස්ථාවක, මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විට, එම බලය හෝ කාර්යය ක්‍රියාත්මක් කිරීම හෝ ඉටුකිරීම කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කළ යුතු ය.

විදේශ ගුවන් යානා තුළ හෝ ඒ හා සම්බන්ධව කරන ලද ක්‍රියා වැරදි ලෙස සැලකිය යුතු බව.

19. (1) 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ, (ආ) ඡේදයේ, (ඇ) ඡේදයේ, (ඈ) ඡේදයේ, (ඉ) ඡේදයේ, (ඊ) ඡේදයේ හෝ (උ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී විදේශ ගුවන් යානයක් තුළ හෝ විදේශ ගුවන් යානයක් හා සම්බන්ධව කරන යම් තැනැත්තකු, ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුවද නොවුව ද, මේ පනතේ මේ කොටස යටතේ වූ වරදකට වරදකරු විය යුතු අතර මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට තැත් කරන හෝ අනුබල දෙන යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, පළමුවෙන් සඳහන් කරන ලද වරදට නියම කරනු ලැබ ඇති දඬුවමටම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මේ උපවගන්තියේ, "අනුබලදීම" යන්නෙහි, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවල, ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(3) පහත දැක්වෙන අවස්ථාවල දී හැර, මේ වගන්තිය යටතේ වූ වරදක් පිළිබඳ නඩු විභාග කිරීමට ශ්‍රී ලංකාවේ කිසිම අධිකරණයකට අධිකරණ බලය නොතිබිය යුතු ය. එම අවස්ථා නම්—

(අ) එම වරද සංයුක්ත කරන ක්‍රියාව ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ලද අවස්ථාවක; හෝ

(ආ) එම වරද සංයුක්ත කරන ක්‍රියාව කරනු ලැබුවේ යම් විදේශ ගුවන් යානයක් තුළ ද, නැතහොත් යම් විදේශ ගුවන් යානයක් හා සම්බන්ධව ද එම විදේශ ගුවන් යානය වරද කළැයි කියනු ලබන තැනැත්තා ද රැගෙන ශ්‍රී ලංකාවට ගොඩ බට අවස්ථාවක; හෝ

(ඇ) එම වරද සංයුක්ත කරන ක්‍රියාව කරනු ලැබුවේ යම් විදේශ ගුවන් යානයක් තුළ ද නැතහොත් යම් විදේශ ගුවන් යානයක් හා සම්බන්ධව ද එම විදේශ ගුවන් යානය, තම ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ශ්‍රී ලංකාව තුළ ඇති හෝ (එවැනි ව්‍යාපාර ස්ථානයක් තමාට නැත්නම්) නිත්‍ය වාසය ශ්‍රී ලංකාව තුළ ඇති බදු ගැනුම්කරුවකුට, නියමු පිරිස රහිතව, බද්දට දෙනු ලැබූ එකක් වන අවස්ථාවක; හෝ

(ඇ) එම වරද සංයුක්ත කරන ක්‍රියාව විදේශ ගුවන් යානයක් හා සම්බන්ධව කරන ලද 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ, (ආ) ඡේදයේ, (ඇ) ඡේදයේ, (ඈ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ, සඳහන් ක්‍රියාවක් හෝ එවැනි යම් ක්‍රියාවක් සිදු කිරීමට තැත්කිරීම හෝ අනුබල දීම වන අවස්ථාවක, එම වරද සිදු කරන තැනැත්තා ශ්‍රී ලංකාව තුළ සිටින්නේ නම්.

මේ පනතේ මේ කොටස යටතේ යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ විට, නිසි බලධරයා විසින් මූලික පරීක්ෂණය පැවැත්විය යුතු බව.

**20.** මේ පනතේ මේ කොටස යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක, සිද්ධි සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් නිසි බලධරයා විසින් පවත්වනු ලැබිය යුතු අතර, එසේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තා ශ්‍රී ලංකාවේ රටවැසියකු නොවන්නේ නම්, ඔහු රටවැසියකු වන රාජ්‍යයේ ආසන්නතම උචිත නියෝජිතයා සමග පණිවුඩ හුවමාරු කර ගැනීමට ඒ තැනැත්තාට සහාය දිය යුතු ය.

නිසි බලධරයාගේ කාර්ය.

**21.** (1) මේ පනතේ මේ කොටස යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබ ඇති බවත්, ඔහු රඳවා තබා ගැනීමට හේතු වූයේ කවර පරිවේෂණ යටතේ ද යන බවත් නිසි බලධරයා විසින්,—

(අ) ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ රට වැසියකු නොවන්නේ නම්, ඒ තැනැත්තා රට වැසියකු වන රාජ්‍යය වෙත දැනුම් දිය යුතු ය ;

(ආ) ඒ වරද සිදු කරන ලද්දේ යම් විදේශ ගුවන් යානයක් තුළද, නැතහොත් යම් විදේශ ගුවන් යානයකට අදාළව ද, ඒ විදේශ ගුවන් යානය ලියාපදිංචි කර ඇති රාජ්‍යය වෙත දැනුම් දිය යුතු ය ;

(ඇ) ඒ වරද සිදු කරන ලද්දේ යම් ගුවන් යානයක් තුළ ද, නැතහොත් යම් ගුවන් යානයකට අදාළව ද, ඒ ගුවන් යානය නියමු පිරිස රහිතව යම් බදු ගැනුම්කරුවකුට බදු දී තිබේ නම්, ඒ බදු ගැනුම්කරුගේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය පිහිටා ඇති රාජ්‍යය වෙත දැනුම් දිය යුතුය. ඒ බදු ගැනුම්කරුට එවැනි ව්‍යාපාර ස්ථානයක් නොමැත්තේ නම් ඒ බදු ගැනුම්කරුගේ නිත්‍ය වාසය ඇති රාජ්‍යය වෙත දැනුම් දිය යුතු ය ;

(ඈ) සම්බන්ධතාවක් ඇති වෙනත් යම් රාජ්‍යයක් වෙත දැනුම් දිය යුතු ය.

(2) 20 වන වගන්තියේ සඳහන් මූලික පරීක්ෂණය අවසාන වීමෙන් පසු නිසි බලධරයා විසින් ස්වකීය නිරණය (1) වන උප වගන්තියේ සඳහන් රාජ්‍යය වෙත වාර්තා කළ යුතු අතර, මූලික පරීක්ෂණයට අදාළ වූ වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව අදහස් කරන්නේ ද යන වග සඳහන් කළ යුතු ය.

22. (1) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දීපන පනතේ උපලේඛනය අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්, ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දීපන පනත සංශෝධනය කිරීම.

"(32) ගමනාවතීර්ණ ගුවන් යානයක් නීති විරෝධී ලෙස අල්ලා ගැනීම හෝ පාලනය කිරීම.

(33) ගමනාවතීර්ණ ගුවන් යානයක ආරක්ෂාවට අනතුරක් සිදු වීමට ඉඩ ඇතිවන පරිදි ඒ ගුවන් යානයේ සිටින මගියකුට එරෙහිව කරනු ලබන ප්‍රචණ්ඩ ක්‍රියා.

(34) සේවාස්ථ ගුවන් යානයක් ගමනාවතීර්ණව තිබෙන විට එහි ආරක්ෂාවට හානි පැමිණීමට ඉඩ ඇති වනසේ, එය විනාශ කිරීම හෝ ඊට හානියක් කිරීම.

(35) සේවාස්ථ ගුවන් යානයක් විනාශ වීමට හෝ ඊට හානි සිදු වීමට ඉඩ ඇති වන සේ යම් උපක්‍රමයක් හෝ ද්‍රව්‍යයක්, එහි තැබීම.

(36) ජාත්‍යන්තර ගුවන් ගමනාගමනය සඳහා පාවිච්චි කරනු ලබන ගුවන් ගමනාගමන පහසුකම් විනාශ කිරීම, ඒවාට හානි පැමිණවීම හෝ ඒවාට අයුතු ලෙස මැදිහත් වීම.

(37) ගුවන් යානාවල ආරක්ෂාවට හානි සිදු වන සේ ව්‍යාජ තොරතුරු සන්නිවේදනය කිරීම.".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දීපන පනතට කරන ලද සංශෝධනය 1978 ජූලි මස 3 වන දින බලපැවැත්වීම ආරම්භ වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

23. (1) හේග් සම්මුතිය, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ එම සම්මුතියට පාර්ශ්වකරුවකු වූ රාජ්‍යයක ආණ්ඩුව අතර වූ උද්දීපන වැඩ පිළිවෙළක් ලෙස ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දීපන පනතේ 3 වන වගන්තියේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු අතර, එකී පනතේ 4 වන වගන්තියේ හෝ වෙනත් විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද—

සම්මුතිය, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ හේග් හෝ මොන්ට්‍රියල් සම්මුතිවල පාර්ශ්වකරුවන් වූ රාජ්‍යවල ආණ්ඩු අතර උද්දීපන වැඩ පිළිවෙළක් විය යුතු බව.

(අ) එම සම්මුතිය එම රාජ්‍යය සම්බන්ධයෙන් බලපැවැත්වීම ආරම්භ වූයේ 1978 ජූලි මස 3 වන දිනට කලින් නම් 1978 ජූලි මස 3 වන දින සිට ; හෝ

(ආ) එම සම්මුතිය එම රාජ්‍යය සම්බන්ධයෙන් බලපැවැත්වීම ආරම්භ වූ දිනය 1978 ජූලි මස 3 වන දිනට පසුව වූ දිනයක් නම්, එම සම්මුතිය එම රාජ්‍යය සම්බන්ධයෙන් බලපැවැත්වීම ආරම්භ වූ දින සිට

ක්‍රියාත්මක වන පරිදි අමාත්‍යවරයා විසින් ඒ රාජ්‍යය සම්බන්ධයෙන් එකී පනතේ 3 වන වගන්තිය යටතේ නියමයක් කරන ලද ලෙස සැලකිය යුතු ය.

එවැනි සෑම නියමයක්ම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර සියලු කාර්ය සඳහා එය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. යම් රාජ්‍යයක් සම්බන්ධයෙන්

නියමයක් කරනු ලැබූ ලෙස මේ උපවගන්තිය යටතේ සැලකෙන්නේ ද ඒ රාජ්‍යය එකී පනතේ කාර්ය සඳහා සන්ධාන රාජ්‍යයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මොන්ට්‍රියල් සම්මුතිය, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ එම සම්මුතිය යට පාර්ශ්වකරුවකු වූ රාජ්‍යයක ආණ්ඩුව අතරවූ උදර්පන වැඩ පිළිවෙලක් ලෙස ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වන වගන්තියේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු අතර, එකී පනතේ 4 වන වගන්තියේ හෝ වෙනත් විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද—

(අ) එම සම්මුතිය එම රාජ්‍යය සම්බන්ධයෙන් බලපැවැත්වීම ආරම්භ වූයේ 1978 ජූලි මස 3 වන දිනට කලින් නම්, 1978 ජූලි මස 3 වන දින සිට ; හෝ

(ආ) එම සම්මුතිය එම රාජ්‍යය සම්බන්ධයෙන් බලපැවැත්වීම ආරම්භ වූ දිනය 1978 ජූලි මස 3 වන දිනට පසුව වූ දිනයක් නම්, එම සම්මුතිය එම රාජ්‍යය සම්බන්ධයෙන් බලපැවැත්වීම ආරම්භ වූ දින සිට

ක්‍රියාත්මක වන පරිදි අමාත්‍යවරයා විසින් ඒ රාජ්‍යය සම්බන්ධයෙන් එකී පනතේ 3 වන වගන්තිය යටතේ නියමයක් කරන ලද ලෙස සැලකිය යුතු ය.

එවැනි සෑම නියමයක්ම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර සියලු කාර්ය සඳහා එය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. යම් රාජ්‍යයක් සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබූ ලෙස මේ උපවගන්තිය යටතේ සැලකෙන්නේ ද ඒ රාජ්‍යය එකී පනතේ කාර්ය සඳහා සන්ධාන රාජ්‍යයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් රාජ්‍යයක් හේග් සම්මුතියේ හෝ මොන්ට්‍රියල් සම්මුතියේ පාර්ශ්වකරුවකු වූ බවට හෝ යම් රාජ්‍යයක් සම්බන්ධයෙන් ඒ යම් සම්මුතියක් බලපැවැත්වීම ආරම්භ වූ දිනය නිශ්චය කරමින් විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එය එහි සඳහන් කාරණා සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

උදර්පනය සම්බන්ධ විධිවිධාන.

24. ගුවන් යානයක් තුළ හෝ ගුවන් යානයක් හා සම්බන්ධව සිදු කරන ලද්දා වූ ද—

(අ) මේ පනතේ මේ කොටස යටතේ වරදක් ; සහ

(ආ) වෙනත් යම් රාජ්‍යයක නීතිය යටතේ වරදක්

සංයුක්ත කරන්නා වූ ද යම් ක්‍රියාවක්, එම ක්‍රියාව කරන ලද්දේ යම් රාජ්‍යයක අධිකරණ බල සීමාව තුළ ද ඒ රාජ්‍යයේ අධිකරණ බල සීමාව තුළ පමණක් නොව එකී වෙනත් රාජ්‍යයේ ද අධිකරණ බල සීමාව තුළ කරන ලද සේ ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා සැලකිය යුතු ය.

25. (1) මේ පනතේ මේ කොටසේ සඳහන් වන්නා වූ ද 1978 ජූලි මස 3 වන දිනයෙන් පසු යම් වේලාවක සිදු කරනු ලැබුවේ යයි කියනු ලබන්නා වූ ද, යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනත යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, එම වරද ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා උදර්පනීය වරදක් වන බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. උදර්පනයට අදාළ විශේෂ විධිවිධාන.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනත යටතේ සන්ධාන රාජ්‍යයක් වන රාජ්‍යයක් විසින් යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා වූ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) උදර්පනය සඳහා වූ ඉල්ලීම කරනු ලැබුවේ යම් වරදක් සම්බන්ධයෙන්ද ඒ වරද හැර;

(ආ) නඩු විභාගයට නියමිත අධිකරණය ඉදිරියේ සනාථ කරන ලද සිද්ධියෙන් ඔප්පු වූ වෙනත් යම් අඩු වරදක් හැර; හෝ

(ඇ) උදර්පනීය වරදක් වන වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විෂයෙහි පහත දැක්වෙන ආකාරයට කටයුතු කිරීම ගැන ශ්‍රී ලංකාවේ ආණ්ඩුව එකඟ වන්නේද ඒ වරද හැර

ඒ තැනැත්තා උදර්පනය කිරීමට පෙර කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් ඒ රාජ්‍යයේ දී ඔහු අත් අඩංගුවට ගැනීම, රඳවා තැබීම, පිමාන්ඩ් භාරයේ තැබීම හෝ ඔහු සම්බන්ධයෙන් වෙනත් ආකාරයකින් කටයුතු කිරීම සිදු නොවන බවට සහතික වීම සඳහා ඒ රාජ්‍යයේ නීතියේ විධිවිධාන සලසා ඇත්නම් හෝ, ඒ බවට ඒ රාජ්‍යයේ ආණ්ඩුව පොරොන්දුවක් දී ඇති බව විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහතික කරන්නේ නම්, ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තා සම්බන්ධයෙන් යට කී පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන කිසිවක් අදාළ නොවිය යුතු ය.

26. මේ පනතේ මේ කොටසෙහි— අර්ථ නිරූපණය.

"විදේශ ගුවන් යානය" යන්නෙන්, ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රාජ්‍යයක ලියාපදිංචි කරන ලද්ද වූ ද, යුද්ධ හමුදා, රේගු හෝ පොලිස් සේවාවල පාවිච්චි වෙමින් පවතින ගුවන් යානයක් නොවන්නා වූ ද ගුවන් යානයක් අදහස් වේ;

"හේග් සම්මුතිය" යන්නෙන්, 1970 දෙසැම්බර් මස 16 වන දින හේග් හි දී අත්සන් කරන ලද ගුවන් යානා නීති විරෝධී ලෙස අල්ලා ගැනීම මැඩ පැවැත්වීම සඳහා වූ සම්මුතිය අදහස් වේ;

" ගමනාවතීර්ණ " යන්න ගුවන් යානයක් සම්බන්ධයෙන් යෙදී ඇති විටක, ගුවන් යානයේ ගමනාරම්භයට ප්‍රථම එහි බාහිර ද්වාර වසන ලද මොහොතින් ආරම්භව ඉන් බැසීම සඳහා ඒ ද්වාර නැවත විවෘත කරනු ලබන මොහොත තෙක් වූ කාල පරිච්ඡේදය අදහස් වන අතර, පියාසර කරන අතරතුර ගුවන් යානය හදිසියේ ගොඩ බැස්ස වීමට සිදු වූ අවස්ථාවක දී, එසේ හදිසියේ ගොඩ බස්ස වන ලද මොහොතේ සිට ඒ ගුවන් යානය ද එහි සිටින මගීන් සහ බඩුබාහිරාදිය ද පිළිබඳ වගකීම උචිත බලධර යන් විසින් භාර ගනු ලබන මොහොත දක්වා වූ කාල පරිච්ඡේදය ද ඊට ඇතුළත් වේ ;

" සේවාස්ථ " යන්න ගුවන් යානයක් සම්බන්ධයෙන් යෙදී ඇති විටක, යම් නිශ්චිත ගුවන් ගමනක් සඳහා භූම්‍යස්ථ කාර්ය මණ්ඩලය විසින් හෝ ගුවන් යානය ගුවන් නියමු පිරිස විසින් හෝ ගුවන් යානය සූදානම් කරන ලද මොහොතින් ආරම්භව ඒ ගුවන් යානය ගොඩ බස්සවන ලද මොහොතේ සිට පැය විසිහතරක් අවසන් වන තෙක් වූ කාල පරිච්ඡේදය අදහස් වන අතර, ගුවන් යානය ගමනාවතීර්ණව ඇති කාල පරිච්ඡේදය ද ඊට ඇතුළත් වේ ;

" මොන්ට්‍රියල් සම්මුතිය " යන්නෙන්, 1971 සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියල් හි දී අත්සන් කරන ලද සිවිල් ගුවන් ගමනාගමනයේ ආරක්ෂාවට එරෙහිව වූ නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා වූ සම්මුතිය අදහස් වේ ;

" ශ්‍රී ලංකා ගුවන් යානය " යන්නෙන්, ගුවන් ගමනාගමන පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ලියා පදිංචි කරන ලද්දා වූ ද යුද්ධ හමුදා, රේගු හෝ පොලිස් සේවාවල පාවිච්චි වෙමින් පවතින ගුවන් යානයක් නොවන්නා වූ ද ගුවන් යානයක් අදහස් වේ.

## උපලේඛනය

### 1963 සැප්තැම්බර් මස 14 වන දින ටෝකියෝ හි දී අත්සන් කරන ලද, ගුවන් යානා තුළ සිදු කරනු ලබන වැරදි සහ ඇතැම් වෙනත් ක්‍රියා පිළිබඳ සම්මුතියේ III වන පරිච්ඡේදය

### ගුවන් යානා අණදෙන නිලධරයා සතු බලතල

#### 5 වන ව්‍යවස්ථාව

**1.** ගුවන් යානය ලියාපදිංචි කරන ලද රාජ්‍යයේ ගුවන් පථයෙහි ගමනාව තීර්ණව හෝ මහා සමුද්‍රය මත හෝ යම් රාජ්‍යයක භූමියට අයත් නොවන ප්‍රදේශයක් මත ගමනාවතීර්ණව ඇත්තා වූ ගුවන් යානයක් තුළ සිටින තැනැත් තකු විසින් ගුවන් යානය තුළ සිදු කරනු ලැබූ හෝ සිදු කිරීමට ආසන්න වැරදි සම්බන්ධයෙන් වන විට දී, ඒ තැනැත්තා ඒ ගුවන් යානය තුළ සිටිය දී ඒ ගුවන් යානය අන්තිම වරට ගුවන් ගත වූ ස්ථානය හෝ එය ඊළඟට ගොඩ බැස්සවීමට අදහස් කර ඇති ස්ථානය ඒ ගුවන් යානය ලියාපදිංචි කර ඇති රාජ්‍යය නොවන වෙනත් යම් රාජ්‍යයක පිහිටා ඇත්තේ නම් මිස, නැතහොත් පාදනන්තරව ඒ

ගුවන් යානය, එය ලියාපදිංචි කර ඇති රාජ්‍යය නොවන වෙනත් යම් රාජ්‍යයක ගුවන් පථයෙහි ඒ තැනැත්තා ඒ ගුවන් යානය තුළ සිටිය දී ගමනාවතීර්ණව ඇත්තේ නම් මිස, එවැනි වැරදි සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

2. 1 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ විධිවිධාන කුමක් වුවද, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, යම් ගුවන් යානයක ගමනාරම්භයට ප්‍රථම එහි බාහිර ද්වාර සියල්ල වසන ලද මොහොතේ සිට ඒ ගුවන් යානයෙන් බැසීම සඳහා එහි යම් දොරක් විවෘත කරනු ලබන තෙක් වූ කාලය තුළ කවර වේලාවක් වුවද ඒ ගුවන් යානය ගමනාවතීර්ණව තිබුණු වේලාවක් ලෙස සැලකිය යුතු ය. හදිසි අවස්ථාවක ගුවන් යානය ගොඩ බැස්සවීමට සිදු වූ විටක, ඒ ගුවන් යානය තුළ සිදු කරනු ලබන වැරදි සහ ක්‍රියා සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වීම, ඒ ගුවන් යානය ද එහි සිටින මගීන් හා බඩුබාහිරාදිය ද පිළිබඳ වගකීම යම් රාජ්‍යයක නිසි බලධරයන් විසින් භාර ගනු ලබන තෙක්, දිගටම බලපවත්වන්නේ ය.

## 6 වන ව්‍යවස්ථාව

1. 1 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයෙන් අදහස් කරනු ලැබූ යම් වරදක් හෝ ක්‍රියාවක් තම ගුවන් යානය තුළ දී යම් තැනැත්තකු විසින් සිදු කරන ලද බව හෝ සිදු කරනු ලැබීමට ආසන්න බව විශ්වාස කිරීමට යුක්තිසහගත හේතු ඒ ගුවන් යානයේ අණදෙන නිලධරයාට ඇති අවස්ථාවක දී, පහත දැක්වෙන කාර්ය සඳහා, එනම්,—

(අ) ගුවන් යානයේ හෝ එහි සිටින තැනැත්තන්ගේ හෝ එහි ඇති බඩුබාහිරාදියේ හෝ ආරක්ෂාව රැක ගැනීමට ; හෝ

(ආ) ගුවන් යානය තුළ මනා සංවිධානය සහ විනය පවත්වා ගැනීමට ; හෝ

(ඇ) ඒ තැනැත්තා නිසි බලධරයන් වෙත භාර දීමට හෝ මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා ගුවන් යානයෙන් බැස්සවීමට

අවශ්‍ය මෙල්ල කිරීම ඇතුළු යුක්ති සහගත ක්‍රියා මාර්ග ඒ අණදෙන නිලධරයා විසින් ඒ තැනැත්තා විෂයෙහි ගනු ලැබිය හැකි ය.

2. මෙල්ල කිරීමට අණදෙන නිලධරයාට හිමිකම ඇති යම් තැනැත්තකු මෙල්ල කිරීම සඳහා සහාය වන ලෙස අනෙකුත් නියමු පිරිසට ඒ ගුවන් යානයේ අණදෙන නිලධරයා විසින් නියම කරනු ලැබිය හැකි හෝ බලය දෙනු ලැබිය හැකි අතර, මෙල්ල කිරීමට තමාට හිමිකම් ඇති යම් තැනැත්තකු මෙල්ල කිරීම සඳහා මගීන්ගේ උපකාරය එකී අණදෙන නිලධරයා විසින් ඉල්ලා සිටිය හැකි ය. නැතහොත් ඔවුන්ට ඒ සඳහා බලය දෙනු ලැබිය හැකි ය. එහෙත් ඔහු විසින් ඔවුන්ට එසේ නියම නොකළ යුතුය. ගුවන් යානයේ හෝ එහි සිටින මගීන්ගේ හෝ එහි ඇති බඩුබාහිරාදියේ ආරක්ෂාව සැලසීමට යම් ක්‍රියාවක් නොපමාවම කළ යුතු යයි විශ්වාස කිරීමට හේතු නියමු පිරිසේ යම් සාමාජිකයකුට හෝ මගියකුට හෝ ඇති විටක දී, යට කී අන්දමේ බලය දීමකින් තොරව, ඒ ක්‍රියාව ඒ නියමු පිරිසේ සාමාජිකයා විසින් හෝ මගියා විසින් කරනු ලැබිය හැකි ය.

## 7 වන ව්‍යවස්ථාව

1. ගුවන් යානය ගොඩ බැස්සවීමෙන් පසු, පහත දැක්වෙන අවස්ථාවල දී මිස, එනම්,—

(අ) ගුවන් යානය ගොඩ බස්සවන ලද ස්ථානය හිමිස්නා රාජ්‍යයක් නොවූ රාජ්‍යයක පිහිටා ඇත්තා වූ ද ඒ තැනැත්තා යානයෙන් බැස්සවීමට අවසර දීම ඒ රාජ්‍යය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නා වූ ද අවස්ථා

වක දී හෝ ඒ තැනැත්තා නිසි බලධරයන් වෙත භාරදීමට හැකිවනු පිණිස 6 වන ව්‍යවස්ථාවේ 1 (ඇ) ඡේදයට අනුකූලව එකී මෙල්ල කිරීමේ ක්‍රියා මාර්ග ගෙන ඇති අවස්ථාවක දී;

(ආ) ගුවන් යානය හදිසියේ ගොඩ බස්සවන ලද්දා වූ ද ඒ තැනැත්තා නිසි බලධරයන්ට භාර දීමට ගුවන් යානයේ අණදෙන නිලධරයාට නොහැකි වන්නා වූ ද අවස්ථාවක දී;

(ඇ) එකී මෙල්ල කිරීමට යටත්ව දිගටම ගමන් කිරීමට ඒ තැනැත්තා එකඟ වන අවස්ථාවක දී

මිස, 6 වන ව්‍යවස්ථාවට අනුකූලව යම් තැනැත්තකු විෂයෙහි නියම කොට ඇති මෙල්ල කිරීමේ ක්‍රියාමාර්ග ඒ ගුවන් යානය ගොඩ බස්සවන ලද යම් ස්ථානයකින් ඔබ්බට අනුගමනය කරගෙන යාම නොකළ යුතු ය.

2. 6 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව මෙල්ල කිරීමට යටත් කොට ඇති තැනැත්තකු සිටින ගුවන් යානයක අණදෙන නිලධරයා විසින්, ප්‍රායෝගික වශයෙන් හැකිතාක් ඉක්මණින් සහ, හැකි නම්, ගුවන් යානය යම් රාජ්‍යයක දේශ සීමාව තුළ ගොඩ බැස්සවීමට පෙර, මෙල්ල කිරීමට යටත් වූ තැනැත්තකු තම ගුවන් යානය තුළ සිටින බවත් එසේ මෙල්ල කිරීමට හේතු වූ කරුණු මොනවාද යන්නත් ඒ රාජ්‍යයේ බලධරයන්ට දැනුම් දිය යුතු ය.

### 8 වන ව්‍යවස්ථාව

1. 1 වන ව්‍යවස්ථාවේ 1 (ආ) ඡේදයෙන් අදහස් කර ඇති යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් තම ගුවන් යානය තුළ සිදු කර ඇති බව හෝ සිදු කිරීමට ආසන්න බව විශ්වාස කිරීමට යුක්ති සහගත කරුණු ඒ ගුවන් යානයේ අණදෙන නිලධරයාට ඇති අවස්ථාවක දී, ඒ ගුවන් යානය ගොඩ බස්සවනු ලබන කවර මුවද රාජ්‍යයක දේශයේ දී 6 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ (අ) හෝ (ආ) අනුඡේදයේ කාර්ය සඳහා අවශ්‍ය වන තාක් දුරට ඒ අණදෙන නිලධරයා විසින් ඒ තැනැත්තා යානයෙන් බස්සවනු ලැබිය හැකි ය.

2. මේ ව්‍යවස්ථාවට අනුකූලව යම් තැනැත්තකු යම් රාජ්‍යයක දේශයක දී යානයෙන් බස්සවන ගුවන් යානයක අණදෙන නිලධරයා විසින්, එසේ ඒ තැනැත්තා යානයෙන් බස්සවනු ලබන බවත් ඔහු එසේ යානයෙන් බැස්සවීමට හේතුත් ඒ රාජ්‍යයේ බලධරයන්ට වාර්තා කළ යුතු ය.

### 9 වන ව්‍යවස්ථාව

1. ගුවන් යානය ලියා පදිංචි කර ඇති රාජ්‍යයේ දණ්ඩ නීතියට අනුකූලව බරපතළ වරදක් වන ක්‍රියාවක් බව ඒ ගුවන් යානයේ අණදෙන නිලධරයා විසින් තම මතයට අනුව විශ්වාස කරනු ලබන යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් ඒ ගුවන් යානය තුළ සිදු කර ඇති බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඒ අණදෙන නිලධරයාට ඇති අවස්ථාවක දී, ඒ ගුවන් යානය ගොඩ බස්සවනු ලබන දේශය අයත් වන යම් ගිවිස්නා රාජ්‍යයක නිසි බලධරයන් වෙත, ඒ අණදෙන නිලධරයා විසින්, ඒ තැනැත්තා භාර දෙනු ලැබිය හැකි ය.

2. පෙරාතුව වූ ඡේදයට අනුකූලව බලධරයන්ට භාර දීමට ගුවන් යානයේ අණදෙන නිලධරයා අදහස් කරන යම් තැනැත්තකු සිටින ගුවන් යානයක් ගිවිස්නා රාජ්‍යයක දේශයට ගොඩ බැස්සවීමේ දී ඒ තැනැත්තා එසේ භාර දීමට තමන් අදහස් කරන බවත්, ඊට හේතුත්, ඒ අණදෙන නිලධරයා විසින්, ප්‍රායෝගික වශයෙන් හැකිතාක් ඉක්මණින් සහ, හැකිනම්, ගුවන් යානය ගොඩ බැස්සවීමට පෙර, ඒ රාජ්‍යයේ නිසි බලධරයන්ට දැනුම් දිය යුතු ය.

3. මේ ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව සැක කරනු ලබන යම් වරදකරුවකු යම් රාජ්‍යයක බලධරයන් වෙත භාර දෙනු ලබන අවස්ථාවක දී, ඒ ගුවන් යානය ලියා පදිංචි කර ඇති රාජ්‍යයේ නීතිය යටතේ නීත්‍යනුකූලව එහි අණදෙන නිලධරයා සතුව ඇති සාක්ෂි සහ තොරතුරු ඒ අණදෙන නිලධරයා විසින් ඒ බලධරයන් වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 10 වන ව්‍යවස්ථාව

මේ සම්මුතියට අනුකූලව නඩු පවරනු ලබන අවස්ථාවල දී, ඒ නඩු පවරනු ලබන්නේ කවර තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තාට සලකන ලද ආකාරය පිළිබඳව වූ යම් නඩු කටයුත්තක දී, ඒ ගුවන් යානයේ අණදෙන නිලධරයා හෝ ඒ ගුවන් යානයේ නියමු පිරිසේ වෙනත් යම් සාමාජිකයකු හෝ ඒ ගුවන් යානයේ යම් මඟියකු හෝ ඒ ගුවන් යානයේ අයිතිකරු හෝ එය සේවයේ යෙදවූ තැනැත්තා හෝ ගමන සිදු කරන ලද්දේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා හෝ වගකීමට බැඳී නොසිටී.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.